# 4 ශ්‍රේණිය සිංහල 2022

## ගුරු අත් පොතට වැඩ පොත අංක 01

### L 1, S 1 නිපුණතා ආවරණය



- **අවබෝධයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා සවන් දෙයි.**

  (පවසන දෙයකට සවන් දීම, කතන්දරවලට සවන් දීම, ළමා ගීතවලට සවන් දීම, ළමා කවිවලට සවන් දීම)

- **අවබෝධයෙන් පැහැදිලි උච්චාරණය සහිත ව අර්ථය පැහැදිලි වන සේ කතා කරයි.**

  (නිදහසේ කතන්දර පැවසීම, මාතෘකාවකට අදාළ ව කතා කිරීම)


**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**

(Dip. In Sci. N.I.E./O.U.S.L.)



Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 4 ශ්‍රේණිය මව්බස (සිංහල)
## $L_1$ $S_1$ ඉගෙනුම් පල

- පවසන ලද දෙයකට අවබෝධයෙන් යුතු ව සවන් දී නිවැරදි ව ප්‍රතිචාර දක්වයි.
- කතන්දරය ඇසුරෙන් අසන ලද ප්‍රශ්නවලට අවබෝධයෙන් යුතු ව පිළිතුරු දෙයි.
- ළමා කවි, ගීතවලට සවන් දෙමින් රිද්මයානුකූල ව ප්‍රතිචාර දක්වයි.
- කතන්දරයක් අනුපිළිවෙළින් යුතු ව නිවැරදි ව ප්‍රකාශ කරයි.
- මාතෘකාවකට අදාළ ව නිවැරදි ව අදහස් ප්‍රකාශ කරයි.

### පවසන දෙයකට සවන් දීම

01. පහත සඳහන් ඡේදයට සවන් දී අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

වනය ඉතා අලංකාර ය. සැම තැනක ම ඇති ගස්වැල් සහ ඒවායේ හට ගන්නා මල් සහ ගෙඩි එහි අලංකාර බව තවත් වැඩි කරයි. ගස්වැල් බහුල නිසා දවල් කාලයේ ද වනය අඳුරු ස්වභාවයක් උසුලයි. බැලූ බැල්මට ඒ අන්ධකාරය බියකරු ලෙස පෙනුණ ද වනය බෙහෙවින් සුන්දර ය.

තැන් තැන්වලින් ගලායන ඇළ දොළවල් නිසා වනය පුරා ම ඇත්තේ සිසිලසකි. තිත්ත පැටවු ඇළ දොළවල පීනන ආකාරය ඉතාමත් දැකුම්කලු ය. දිය දහරා ගලා යන හඬ වනයේ ඇති නිහඬ බව බිඳ දමයි.

වනය පුරා පියාසර කරන කුරුල්ලන්ගේ නාදය මිහිරි බවක් ගෙන දෙයි. තැනෙක මොනරා පිල් විදහා නටන ආකාරය ඉතා මනහර ය. ගසින් ගසට පැන යමින් පලවැල් සොයන වඳුරු රංචු වනයේ දැකිය හැකි සුලබ දසුනකි.

තුරුලතා වදුලින් පිරුණු වනය දෙස කොතරම් වේලාවක් බලා සිටිය ද සෑහීමකට නම් පත් නොවේ. වනය එතරම් අසිරිමත් ය.

1. වනයේ අලංකාර බව වැඩි වන්නේ කුමක් නිසා ද ?

..........................................................................................................

..........................................................................................................

2. දවල් කාලයේ වනය අඳුරු වී ඇත්තේ ඇයි ?

..........................................................................................................

3. වනයට සිසිලසක් ගෙන දෙන්නේ මොනවා නිසා ද ?

..........................................................................................................

4. වනයේ නිහඬ බව බිඳ හෙළන්නේ කුමකින් ද ?

..........................................................................................................

5. ගසින් ගසට පැන යමින් වඳුරන් සොයන්නේ මොනවා ද ?

..........................................................................................................

# කතන්දරවලට සවන් දීම

02. පහත සඳහන් කතන්දරයට සවන් දී අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

දිනක් පඬිතුමෙක් පොත් මල්ලක් රැගෙන ගඟ ළඟට ආවේ ය. එදින ගඟේ ජලය ද වැඩි වී තිබුණු අතර, සැඩ පහර ද දරුණු වී තිබුණි. මේ නිසා තොටියා ඔරුව පැදීම නතර කර තිබුණේ ය. ගඟෙන් එගොඩ වීමට ආ මගීන්ට ද කරුණු කියා තොටියා ඔවුන් ආපසු යැවුවේ ය.

එහෙත් පඬිතුමා කිසි ම විමසීමක් නොකර ඔරුවට නැගී ඔරුව පදින ලෙස තොටියාට කිවුවේ ය.

''අද ගඟේ ජලය වැඩි යි සැඩ පහරත් දරුණු යි. ඒ නිසා අද නම් ඔරුව පදින්න බැහැ'' තොටියා කිවුවේ ය.

''මට ඉක්මනින් එගොඩට යන්න ඕනෑ. ඒ නිසා කොහොම හරි ඔරුව පදින්න''යි පඬිතුමා තොටියාට පැවසුවේ ය.

''මම ඔබතුමාට එක වතාවක් කිව්ව නේ. අද ඔරුව පැදීම හරි ම අවදානම්'' යැයි තොටියා පඬිතුමාට පැවසී ය.

''කමක් නැහැ. මාව එගොඩට ගෙනියන්න'' යි පඬිතුමා නැවතත් කිවුවේ ය.

තොටියා අපහසුවෙන් ඔරුව පදවන්නට විය. ඒ අතරතුර පඬිතුමා පොතක් දිග හැර ගෙන කියවන්නට විය.

ගඟේ සුළු දුරක් ගිය පසු ''ඔබට පොත් කියවන්නට පුළුවනි දැ'යි පඬිතුමා තොටියාගෙන් විමසී ය.

''අනේ බැහැ පඬිතුමනි'' තොටියා පිළිතුරු දුන්නේ ය.

''එහෙනම් ඔබේ ජීවිතයෙන් බාගයක් ඉවරයි'' පඬිතුමා පැවසුවේ ය.

තව ටිකක් දුර යන විට ''ඔබට ලියන්නට පුළුවනි ද'යි පඬිතුමා ඇසුවේ ය.

''බැහැ පඬිතුමනි'' තොටියා කිවුවේ ය.

''එහෙනම් ඔබේ ජීවිතයෙන් තුන් කාලක් ඉවර යි.'' පඬිතුමා පැවසුවේ ය.

ඔරුව ගඟ මැදට පැමිණියේ ය. ඇත. සැඩ පහර ද තවත් දරුණු විය. ඔරුව පෙරළෙන බව තොටියා හොඳාකාරව ම දැන ගත්තේ ය.

එසේ දැන, ''ඔබතුමාට පීනන්න පුළුවනි දැ'යි තොටියා පඬිතුමාගෙන් විමසුවේ ය.

''මම පීනන්න දන්නේ නැහැ'' පඬිතුමා කිවුවේ ය.

''එහෙනම් ඔබතුමාගේ මුළු ජීවිතේ ම ඉවර යි. දැන් ඔරුව පෙරළෙනවා. මට නම් පීනන්න පුළුවනි.'' තොටියා පඬිතුමාට පැවසුවේ ය. එසේ කියනවාත් සමඟ ම ඔරුව ගඟට පෙරළුණේ ය.

1. පඬිතුමා ගඟ ළඟට පැමිණියේ කුමක් රැගෙන ද ?

........................................................................................................................................

2. තොටියා ඔරුව පැදීම නතර කර තිබුණේ ඇයි ?

.................................................................................................................................................

3. තොටියා අපහසුවෙන් ඔරුව පදවන අතරතුර පඬිතුමා කළේ කුමක්ද ?

.................................................................................................................................................

4. 'එහෙනම් ඔබතුමාගේ මුළු ජීවිතේ ම ඉවර යි' තොටියා මෙසේ කීවේ ඇයි ?

.................................................................................................................................................

5. අවසානයේ පඬිතුමාට කුමක් සිදු වන්නට ඇත් ද ?

.................................................................................................................................................

## <u>ළමා ගීතවලට සවන් දීම</u>

03. පහත සඳහන් ගීතයට සවන් දී අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

පාන්දරින් ඉස්කෝලෙට ටැන්ටු කරත්තෙන්
තොප්පි ගොනා ඉස්සරහින් මං පිටිපස්සෙන්
හනි හනිකට උඹ යනකොට //
පාර කියන්නෑ තෝනෙන් - පාර කියන්නෑ කෙවිටෙන්

පුංචි කාලේ උඹට බොන්න - එරිච්ච කිරි බිව්වලු මං
වත්ත පහළ උඹේ පිනුම් - දැක්කම හිනැහුණාලු මං
ලාඩම් නැති උඹේ පා කුර - ගල් කන්දෙදි රිදෙන තරම්
උඹේ කඳුළු මට කියද්දි - උඹට හොරෙන් අඬනව මං

පාර කියන්නෑ තෝනෙන් - පාර කියන්නෑ කෙවිටෙන්

ඉස්කෝලෙන් ශිල්ප අරන් - මං ලොකු මිනිහෙක් වෙන්නම්
බිවුව කිරට ඇද්ද බරට - කළගුණ මං සලකන්නම්
බැරි බර දෙන මේ වියකර - නුඹේ කරෙන් ගලවන්නම්
උජාරුවට දුව පනින්න - ගෙජ්ජි වැලක් පලඳන්නම්

පාර කියන්නෑ තෝනෙන් - පාර කියන්නෑ කෙවිටෙන්
පාන්දරින් ඉස්කෝලෙට . . .



**පද රචනය :**
සෝමතිලක දිසානායක
**ගායනය :**
විශාරද හර්ෂණ දිසානායක

1. ගීතයෙන් කියැවෙන්නේ කවුරුන් ගැන ද ?

.................................................................................................................................................

2. ළමයා පාන්දරින් යන්නේ කොහේ ද ?

.................................................................................................................................................

3. ළමයා ලොකු මිනිහෙක් වෙන්නේ කොසේ ද ?

.................................................................................................................................................

4. ගොනාගේ කරේ පලඳන්නම් කියන්නේ මොනවා ද ?

.................................................................................................................................................

# <u>ළමා කවිවලට සවන් දීම</u>

04. පහත සඳහන් කවි පෙළට සවන් දී අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

මුනි සිරිපා සිඹිමින් නේ
සමනොළ ගිරි පෙදෙසින් නේ
මඳ සුළඟයි මේ එන්නේ
මගේ පුතා නිදියන් නේ

දෙව් පුර මෙන් දෙවියන් නේ
සිරි ලක්දිව් බබළන් නේ
එහි සක්දෙව් රජු මෙන් නේ
මගේ පුතා ලොකු වෙන් නේ

කරදර දහසක් හමු වී
ඉන්ටැකි නම් සිනා වෙ වී
ඔහු මෙලොවට පහළ දෙ වී
රජෙකැයි සලකනු මැන වී

තමන් ලැබූ දිවි පෙවෙතේ
කොටසක් රට සමය වෙතේ
පුද නොකළොත් උඹෙන් පුතේ
මෙලොවට කිසි පලක් නැතේ

ජාතිය රන් විමනක් වේ
ආගම මිණි පහනක් වේ
එය රැක ගන්නට මෙලොවේ
සමත් වෙතොත් පුත නුඹ වේ

ඉටු කොට කළ යුතු යුතුකම්
ලැබුණත් ලෝකෙන් ගැරහුම්
ඉවසන්නට පුළුවන් නම්
උඹයි මගේ පුතා උතුම්

කාටත් හිමි පොදු දේ නම්
නැති බැරි හිඟ අවහිර කම්
මේ දේ මැඩ ගෙන විස්කම්
පෑම තමයි සුරුවිරු කම්



**පූජ්‍ය, ටිබෙට් ජාතික ඇස්. මහින්ද හිමි**

1. කවියේ සඳහන් පුතුට දෙන උපදෙස් තුනක් ලියන්න.

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

2. කවිය උපුටා ගත් ග්‍රන්ථය කුමක් ද?

.............................................................................................................................

3. එම ග්‍රන්ථය රචනා කර ඇත්තේ කවුරුන් විසින් ද?

.............................................................................................................................

4. කවියා ජාතිය සහ ආගම සමාන කර ඇත්තේ මොනවාට ද ?

.............................................................................................................................

5. කවියේ සඳහන් පහත වචනය වල අර්ථය ලියන්න.

සමය - ........................................ රන් විමනක් - ........................................

මිණි පහනක් - ........................................ මැඩ ගෙන - ........................................

## නිදහසේ කතන්දර පැවසීම

05. පහත සිද්ධියෙන් පටන් ගෙන කුඩා කතන්දරයක් ගොඩ නඟන්න.

- ✓ විශාල නිවස අසල උසට වැඩුණු බට පඳුරකි. ලේන් කූඩුව බිම වැටී තිබුණි. ලේන් අම්මා සහ තාත්තා හක්ෂ නගමින් ඒ මේ අත දුව පැන්නෝය.

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

## මාතෘකාවකට අදාළ ව කතා කිරීම

06. පහත එක් මාතෘකාවක් තෝරාගෙන මාතෘකාවට අදාළ ව කතාවක් කරන්න.

(මගේ ගම, මගේ විනෝදාංශය, මා කැමති කතා පොත, මා සහභාගි වූ චාරිකාවක්, මගේ අනාගත බලාපොරොත්තුව)

උදා :

### මගේ ගම

1. මගේ ගම ඉද්දමල්ගොඩ.
2. ඉද්දමල්ගොඩ රත්නපුර දිස්ත්‍රික්කයට අයත් ගමක්.
3. මගේ ගමේ තේ, රබර් වැනි බෝග වගා කර තිබේ.
4. කඳු පන්තියකින් වට වූ මගේ ගම ඉතා අලංකාර යි.
5. මම ගමට පණ මෙන් ආදරය කරමි.

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

# පිළිතුරු



Answer

# 4 ශ්‍රේණිය මව්බස (සිංහල)

## $L_1$ $S_1$ ඉගෙනුම් පල

- පවසන ලද දෙයකට අවබෝධයෙන් යුතු ව සවන් දී නිවැරදි ව ප්‍රතිචාර දක්වයි.
- කතන්දරය ඇසුරෙන් අසන ලද ප්‍රශ්නවලට අවබෝධයෙන් යුතු ව පිළිතුරු දෙයි.
- ළමා කවි, ගීතවලට සවන් දෙමින් රිද්මයානුකූල ව ප්‍රතිචාර දක්වයි.
- කතන්දරයක් අනුපිළිවෙළින් යුතු ව නිවැරදි ව ප්‍රකාශ කරයි.
- මාතෘකාවකට අදාළ ව නිවැරදි ව අදහස් ප්‍රකාශ කරයි.

### පවසන දෙයකට සවන් දීම

01. පහත සඳහන් ඡේදයට සවන් දී අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

වනය ඉතා අලංකාර ය. සැම තැනක ම ඇති ගස්වැල් සහ ඒවායේ හට ගන්නා මල් සහ ගෙඩි එහි අලංකාර බව තවත් වැඩි කරයි. ගස්වැල් බහුල නිසා දවල් කාලයේ ද වනය අඳුරු ස්වභාවයක් උසුලයි. බැලූ බැල්මට ඒ අන්ධකාරය බියකරු ලෙස පෙනුණ ද වනය බෙහෙවින් සුන්දර ය.

තැන් තැන්වලින් ගලායන ඇළ දොළවල් නිසා වනය පුරා ම ඇත්තේ සිසිලසකි. තිත්ත පැටවු ඇළ දොළවල පීනන ආකාරය ඉතාමත් දැකුම්කලු ය. දිය දහරා ගලා යන හඬ වනයේ ඇති නිහඬ බව බිඳ දමයි.

වනය පුරා පියාසර කරන කුරුල්ලන්ගේ නාදය මිහිරි බවක් ගෙන දෙයි. තැනෙක මොනරා පිල් විදහා නටන ආකාරය ඉතා මනහර ය. ගසින් ගසට පැන යමින් පලවැල් සොයන වඳුරු රංචු වනයේ දැකිය හැකි සුලබ දසුනකි.

තුරුලතා වදුලින් පිරුණු වනය දෙස කොතරම් වේලාවක් බලා සිටිය ද සෑහීමකට නම් පත් නොවේ. වනය එතරම් අසිරිමත් ය.

1. වනයේ අලංකාර බව වැඩි වන්නේ කුමක් නිසා ද ?

සැම තැනක ම ඇති ගස්වැල් සහ ඒවායේ හට ගන්නා මල් සහ ගෙඩි නිසා.

2. දවල් කාලයේ වනය අඳුරු වී ඇත්තේ ඇයි ?

ගස්වැල් බහුල නිසා.

3. වනයට සිසිලසක් ගෙන දෙන්නේ මොනවා නිසා ද ?

තැන් තැන්වලින් ගලායන ඇළ දොළවල් නිසා.

4. වනයේ නිහඬ බව බිඳ හෙළන්නේ කුමකින් ද ?

දිය දහරා ගලා යන හඬ නිසා.

5. ගසින් ගසට පැන යමින් වඳුරන් සොයන්නේ මොනවා ද ?

පලවැල්.

## කතන්දරවලට සවන් දීම

02. පහත සඳහන් කතන්දරයට සවන් දී අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

දිනක් පඬිතුමෙක් පොත් මල්ලක් රැගෙන ගඟ ළඟට ආවේ ය. එදින ගඟේ ජලය ද වැඩි වී තිබුණු අතර, සැඩ පහර ද දරුණු වී තිබුණි. මේ නිසා තොටියා ඔරුව පැදීම නතර කර තිබුණේ ය. ගඟෙන් එගොඩ වීමට ආ මගීන්ට ද කරුණු කියා තොටියා ඔවුන් ආපසු යැවුවේ ය.

එහෙත් පඬිතුමා කිසි ම විමසීමක් නොකර ඔරුවට නැගී ඔරුව පදින ලෙස තොටියාට කිවුවේ ය.

''අද ගඟේ ජලය වැඩි යි සැඩ පහරත් දරුණු යි. ඒ නිසා අද නම් ඔරුව පදින්න බැහැ'' තොටියා කිවුවේ ය.

''මට ඉක්මනින් එගොඩට යන්න ඕනෑ. ඒ නිසා කොහොම හරි ඔරුව පදින්න''යි පඬිතුමා තොටියාට පැවසුවේ ය.

''මම ඔබතුමාට එක වතාවක් කිව්ව නේ. අද ඔරුව පැදීම හරි ම අවදානම්'' යැයි තොටියා පඬිතුමාට පැවසී ය.

''කමක් නැහැ. මාව එගොඩට ගෙනියන්න'' යි පඬිතුමා නැවතත් කිවුවේ ය.

තොටියා අපහසුවෙන් ඔරුව පදවන්නට විය. ඒ අතරතුර පඬිතුමා පොතක් දිග හැර ගෙන කියවන්නට විය.

ගඟේ සුළු දුරක් ගිය පසු ''ඔබට පොත් කියවන්නට පුළුවනි දැ'යි පඬිතුමා තොටියාගෙන් විමසී ය.

''අනේ බැහැ පඬිතුමනි'' තොටියා පිළිතුරු දුන්නේ ය.

''එහෙනම් ඔබේ ජීවිතයෙන් බාගයක් ඉවරයි'' පඬිතුමා පැවසුවේ ය.

තව ටිකක් දුර යන විට ''ඔබට ලියන්නට පුළුවනි ද'යි පඬිතුමා ඇසුවේ ය.

''බැහැ පඬිතුමනි'' තොටියා කිවුවේ ය.

''එහෙනම් ඔබේ ජීවිතයෙන් තුන් කාලක් ඉවර යි.'' පඬිතුමා පැවසුවේ ය.

ඔරුව ගඟ මැදට පැමිණියේ ය. ඇත. සැඩ පහර ද තවත් දරුණු විය. ඔරුව පෙරළෙන බව තොටියා හොඳාකාරව ම දැන ගත්තේ ය.

එසේ දැන, ''ඔබතුමාට පීනන්න පුළුවනි දැ'යි තොටියා පඬිතුමාගෙන් විමසුවේ ය.

''මම පීනන්න දන්නේ නැහැ'' පඬිතුමා කිවුවේ ය.

''එහෙනම් ඔබතුමාගේ මුළු ජීවිතේ ම ඉවර යි. දැන් ඔරුව පෙරළෙනවා. මට නම් පීනන්න පුළුවනි.'' තොටියා පඬිතුමාට පැවසුවේ ය. එසේ කියනවාත් සමඟ ම ඔරුව ගඟට පෙරළුණේ ය.

1. පඬිතුමා ගඟ ළඟට පැමිණියේ කුමක් රැගෙන ද ?

පොත් මල්ලක් රැගෙන

2. තොටියා ඔරුව පැදීම නතර කර තිබුණේ ඇයි ?

ගඟේ ජලය ද වැඩි වී, සැඩ පහර ද දරුණු වී තිබුණු නිසා.

3. තොටියා අපහසුවෙන් ඔරුව පදවන අතරතුර පඬිතුමා කළේ කුමක්ද ?

පොතක් දිග හැර ගෙන කියවීම.

4. 'එහෙනම් ඔබතුමාගේ මුළු ජීවිතේ ම ඉවර යි' තොටියා මෙසේ කීවේ ඇයි ?

පඬිතුමා පීනන්න දන්නේ නැති නිසා.

5. අවසානයේ පඬිතුමාට කුමක් සිදු වන්නට ඇත් ද ?

දියේ ගිලී මිය යන්නට ඇත.

## ළමා ගීතවලට සවන් දීම

03. පහත සඳහන් ගීතයට සවන් දී අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

පාන්දරින් ඉස්කෝලෙට ටැන්ටු කරත්තෙන්
තොප්පි ගොනා ඉස්සරහින් මං පිටිපස්සෙන්
හනි හනිකට උඹ යනකොට //
පාර කියන්නෑ තෝනෙන් - පාර කියන්නෑ කෙවිටෙන්



පුංචි කාලේ උඹට බොන්න - එරිච්ච කිරි බිව්වලු මං
වත්ත පහළ උඹේ පිනුම් - දැක්කම හිනැහුණාලු මං
ලාඩම් නැති උඹේ පා කුර - ගල් කන්දෙදි රිදෙන තරම්
උඹේ කඳුළු මට කියද්දි - උඹට හොරෙන් අඬනව මං

පාර කියන්නෑ තෝනෙන් - පාර කියන්නෑ කෙවිටෙන්

ඉස්කෝලෙන් ශිල්ප අරන් - මං ලොකු මිනිහෙක් වෙන්නම්
බිවුව කිරට ඇද්ද බරට - කළගුණ මං සලකන්නම්
බැරි බර දෙන මේ වියකර - නුඹේ කරෙන් ගලවන්නම්
උජාරුවට දුව පනින්න - ගෙජ්ජි වැලක් පලඳන්නම්

පාර කියන්නෑ තෝනෙන් - පාර කියන්නෑ කෙවිටෙන්
පාන්දරින් ඉස්කෝලෙට . . .

**පද රචනය :**
සෝමතිලක දිසානායක
**ගායනය :**
විශාරද හර්ෂණ දිසානායක

1. ගීතයෙන් කියැවෙන්නේ කවුරුන් ගැන ද ?

ගොනා ගැන

2. ළමයා පාන්දරින් යන්නේ කොහේ ද ?

ඉස්කෝලෙට

3. ළමයා ලොකු මිනිහෙක් වෙන්නේ කොසේ ද ?

ඉස්කෝලෙන් ශිල්ප අරන්

4. ගොනාගේ කරේ පලඳන්නම් කියන්නේ මොනවා ද ?

ගෙජ්ජි වැලක්

# <u>ළමා කවිවලට සවන් දීම</u>

04. පහත සඳහන් කවි පෙළට සවන් දී අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

මුනි සිරිපා සිඹිමින් නේ
සමනොළ ගිරි පෙදෙසින් නේ
මඳ සුළඟයි මේ එන්නේ
මගේ පුතා නිදියන් නේ

දෙව් පුර මෙන් දෙව්යන් නේ
සිරි ලක්දිව් බබළන් නේ
එහි සක්දෙව් රජු මෙන් නේ
මගේ පුතා ලොකු වෙන් නේ

කරදර දහසක් හමු වී
ඉන්ටැකි නම් සිනා වෙ වී
ඔහු මෙලොවට පහළ දෙ වී
රජෙකැයි සලකනු මැන වී

තමන් ලැබූ දිවි පෙවෙතේ
කොටසක් රට සමය වෙතේ
පුද නොකළොත් උඹෙන් පුතේ
මෙලොවට කිසි පලක් නැතේ

ජාතිය රන් විමනක් වේ
ආගම මිණි පහනක් වේ
එය රැක ගන්නට මෙලොවේ
සමත් වෙතොත් පුත නුඹ වේ

ඉටු කොට කළ යුතු යුතුකම්
ලැබුණත් ලෝකෙන් ගැරහුම්
ඉවසන්නට පුළුවන් නම්
උඹයි මගේ පුතා උතුම්

කාටත් හිමි පොදු දේ නම්
නැති බැරි හිඟ අවහිර කම්
මේ දේ මැඩ ගෙන විස්කම්
පෑම තමයි සුරුවිරු කම්



**පූජ්‍ය, ටිබෙට් ජාතික ඇස්. මහින්ද හිමි**

1. කවියේ සඳහන් පුතුට දෙන උපදෙස් තුනක් ලියන්න.

කරදර දහසක් හමු වුණත් සිනා වෙවී සතුටින් ඉන්න.

දිවි පෙවෙතේ කොටසක් රට සමය වෙනුවෙන් පුදන්න.

ලෝකෙන් ගැරහුම් ලැබුණත් ඉවසා යුතුකම් ඉටු කරන්න.

2. කවිය උපුටා ගත් ග්‍රන්ථය කුමක් ද?

ජාතික තොටිල්ල (දරු නැළවිල්ල)

3. එම ග්‍රන්ථය රචනා කර ඇත්තේ කවුරුන් විසින් ද?

පූජ්‍ය, ටිබෙට් ජාතික ඇස්. මහින්ද හිමියන්

4. කවියා ජාතිය සහ ආගම සමාන කර ඇත්තේ මොනවාට ද ?

ජාතිය රන් විමනකට, ආගම මිණි පහනකට

5. කවියේ සඳහන් පහත වචනය වල අර්ථය ලියන්න.

සමය - ජාතිය
රන් විමනක් - රත්තරන් නිවසක්
මිණි පහනක් - මැණික් පහනක්
මැඩ ගෙන - විඳ දරාගෙන

## නිදහසේ කතන්දර පැවසීම

05. පහත සිද්ධියෙන් පටන් ගෙන කුඩා කතන්දරයක් ගොඩ නගන්න.

- ✓ විශාල නිවස අසල උසට වැඩුණු බට පඳුරකි. ලේන් කූඩුව බිම වැටී තිබුණි. ලේන් අම්මා සහ තාත්තා හඬෂ නගමින් ඒ මේ අත දුව පැන්නෝය.

මම එම සිද්ධිය දුටුවෙමි. මම නංගිට වතුර කෝප්පයක් රැගෙන එන මෙන් පැවසුවෙමි. පසුව ලේන් පැටියාට වතුර පොවා කිරි ටිකකුත් සාදා දුන්නෙමි. ඉන් අනුරුව මම තාත්තාට හා අම්මිමට කතා කළෙමි.

තාත්තා ලේන් කූඩුවේ ලේන් පැටියාව තබා බටපඳුර උඩින් තිබ්බේ ය. ටික වේලාවකට පසු ලේන් අම්මාත් ලේන් තාත්තාත් පැටවා සිටි තැනට සතුටින් පැමිණියෝ ය.

ලේන් පැටියාගේ ජීවිතය බේරා ගැනීම ගැන මමත් නංගීත් සතුටු වුණොමු. අප කළ යහපත් ක්‍රියාව අපි හොඳ වැඩ පොතේ ද ලියා තැබුවෙමු.

## මාතෘකාවකට අදාළ ව කතා කිරීම

06. පහත එක් මාතෘකාවක් තෝරාගෙන මාතෘකාවට අදාළ ව කතාවක් කරන්න.

(මගේ ගම, මගේ විනෝදාංශය, මා කැමති කතා පොත, මා සහභාගි වූ චාරිකාවක්, මගේ අනාගත බලාපොරොත්තුව)

උදා :

### මගේ ගම

1. මගේ ගම ඉද්දමල්ගොඩ.
2. ඉද්දමල්ගොඩ රත්නපුර දිස්ත්‍රික්කයට අයත් ගමක්.
3. මගේ ගමේ තේ, රබර් වැනි බෝග වගා කර තිබේ.
4. කඳු පන්තියකින් වට වූ මගේ ගම ඉතා අලංකාර යි.
5. මම ගමට පණ මෙන් ආදරය කරමි.

1. මගේ ගම වත්තේගම යි.
2. වත්තේගම මහනුවර දිස්ත්‍රික්කයට අයත් ගමක්.
3. මගේ ගමේ තේ, වී වැනි බෝග වගා කර තිබේ.
4. කඳු පන්තියකින් වට වූ මගේ ගම ඉතා අලංකාර යි.
5. මම ගමට පණ මෙන් ආදරය කරමි.

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප **3in1 Youtube** නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

<u>ස්තූතියි !</u>

**හසිත හෙට්ටිආරච්චි**

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



**3 in 1 youtube** නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ